*සැ. යු.* - 2025.07.18 වැනි දින පළ කරන ලද අංක 2446 *ගැසට් පත්‍රයේ* IV(අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,447 - 2025 ජූලි මස 25 වැනි සිකුරාදා - 2025.07.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 972 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 975 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 අගෝස්තු 15 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 අගෝස්තු 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජූනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඬිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ.බ.*)

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

971 - B 082704 — 5,403 (2025/07)
F 1 -

# පළාත් පාලන නිවේදන

**අකුරණ ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂය සඳහා ගවමස් වෙළඳසැල්/එළුමස් වෙළඳසැල් පවත්වාගෙන යාම වෙනුවෙන් වූ ගෝ ඝාතක බලපත්‍ර නිකුත් කිරීමට අදාළව ගෝ ඝාතක ආඥාපනත 7(2) උපවගන්තිය යටතේ විරෝධතා කැඳවීමේ නිවේදනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පහත උපලේඛනයේ සඳහන් අය විසින් ඒ ඒ ස්ථානයේ පෞද්ගලික එළ ගවමස් වෙළඳාම කරගෙන යාම සඳහා බලපත්‍ර ලබා ගැනීමට ඉදිරිපත්ව සිටින බව ගෝඝාතක ආඥාපනතේ 272 වැනි අධිකාරිය 7(2) වැනි වගන්තිය ප්‍රකාර 2025 මැයි මස 20 වැනි දින තීරණ අංක 1477 යටතේ ගාස්තු පැනවීමට තීරණය කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙහි පහත උපලේඛනයෙහි නම් සඳහන් ඉල්ලුම්කරුවන් විසින් අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අනුරූපීව සඳහන් ලිපිනය ඇති ස්ථානයේ එහි විස්තර කර ඇති ස්වභාවයේ ගවමස් වෙළෙඳසැලක්/එළුමස් වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා වෙළඳ බලපත්‍රයක් ලබා ගැනීමට ඉල්ලුම් කර ඇති බව නිවේදනය කරමි.

මෙම බලපත්‍රය නිකුත් කිරීම පිළිබඳව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් ඒ කුමක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14 (දාහතරක්) ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමඟ කියවිය යුතු ගෝඝාතක ආඥාපනතේ 7(2) උපවගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් නිවේදනය කරමි.

ඩී. ජී. එම්. බී. රණසිංහ,
ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව.

2025 වර්ෂයේ ජුනි මස 06 වැනි දින,
අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *ඉල්ලුම්කරුගේ නම* | *ගවමස් වෙළඳසැල පවත්වාගෙන යාමට අපේක්ෂිත ස්ථානය* | *වෙළඳාමේ ස්වභාවය* |
|---|---|---|---|
| 01 | බී. එම්. මුසම්මිල් මයා | 562, නිරුල්ල, අකුරණ | ගවමස් |

07-781

---

සංශෝධනයයි

**කුරුණෑගල ප්‍රාදේශීය සභාව**

මහජනයා වෙත කරනු ලබන දැනුම් දීමයි

**පොදු මාර්ගයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද මාර්ගයක පළල සංශෝධනය කිරීමේ නිවේදනය**

කුරුණෑගල ප්‍රාදේශීය සභාව විසින් 2022.11.15 දින අංක 2306/16 දරන අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ ප්‍රකාශයට පත් කරන ලද සභාව සතු මාර්ග උපලේඛනයේ අනු අංක 825 ලෙස සඳහන් මාර්ගයේ පළල 2025.07.03 දින අප සභාවේ පැවති මුදල් හා ප්‍රතිපත්තිමය කාරක සභාවේ තීරණ අංක 09 යටතේ පහත පරිදි සංශෝධනය කරනු ලබන බවට නිවේදනය කරමි.

එල්. පී. ජගත් ගුණතිලක,
සභාපති,
කුරුණෑගල ප්‍රාදේශීය සභාව.

2025 ජූලි මස 09 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *මාර්ග අනු අංකය* | *මාර්ගයේ අංකය* | *මාර්ගයේ නම* | *මාර්ගයේ සංශෝධිත පළල මීටර්* |
|---|---|---|---|
| 825 | NWP KNPC 270 37 | මහලන්ද වත්ත මාර්ගය | 6.1 |

07-782

---

**යාපනය මහ නගර සභාව**

නල්ලූර් කන්ද සුවාමි කෝවිලේ වාර්ෂික මහා උත්සව සමයේ දී යාපනය මහ නගර සභාව විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් පිළිබඳව *ගැසට්* පත්‍රයේ පළ කිරීම

මෙම ගැසට් නිවේදනය 1947 අංක 29 දරන මහ නගර සභා ආඥාපනතේ 56 වන වගන්තියට අනුකූලව සහ යාපනය මහ නගර සභාව විසින් නිකුත් කරන ලද ගැසට් නිවේදනය මගින් සම්මත කරන ලද 2017.06.16 දිනැති අංක 2024 දරන රෙගුලාසි සහ 2025.01.24 දිනැති අංක 2421 දරන නීතිරීතිවලට අනුකූලවත් 2025.06.23 දිනැති අංක JMC/2025/06/09 දරන මහ නගර සභාවේ මාසික මහා සභා රැස්වීමේ යෝජනාවට අනුකූලව ප්‍රකාශයට පත් කරන බව මෙයින් ප්‍රකාශ කරමි. සභාවේ තීරණ අනුකූලවත් ප්‍රකාශයට පත් කර ඇත.

වී. මතිවදනී,<br>
නගරාධිපතිනි,<br>
මහනගර සභාව,<br>
යාපනය.

2025 ජූලි මස 17 වැනි දින,<br>
මහ නගර සභා කාර්යාලය,<br>
යාපනය.

**ක්‍රියාකාරකම්**

1. නල්ලූර් කන්ද සුවාමි කෝවිල් මහා උත්සව සමය සෑම වසරකම ජූලි මස අමාවක දින සිට හයවන දින කොඩි එසවීමෙන් ආරම්භ වන අතර එය දින විසිහතක් පුරා පැවැත්වේ.

2. වාර්ෂික මහා උත්සවය ආරම්භ වීමට මාසයකට පෙර දෙවතාවක් උත්සව සංවිධාන කටයුතු පිළිබඳ සාකච්ඡා සංවිධානය කෙරේ. පළමු සාකච්ඡාවෙන් පසු, මාර්ග බාධක දමා ඇති ප්‍රදේශය තුළට පැමිණෙන ස්ථිර පදිංචිකරුවන් සහ වෙළඳුන්ට වෙනම සාකච්ඡාවක් සඳහා ආරාධනා කරනු ලබන අතර, ඔවුන්ගේ අදහස් ද සැළකිල්ලට ගෙන යාපනය මහ නගර සභාව විසින් උත්සවයේ අනෙකුත් කටයුතු ආරම්භ කරනු ඇත.

3. වාර්ෂික මහා උත්සවයේ ආරම්භය සනිටුහන් කරන කොඩි එසවීමේ දිනට පළමු දිනය වන වයිරවර් ආශිර්වාද උත්සව දිනයේ අළුයම සිට, වයිරවර්ගේ ආශිර්වාද උත්සවයෙන් අවසන් වන විසිහත්වන දින උත්සවයේ මධ්‍යම රාත්‍රිය දක්වා කෝවිල අවට දමා ඇති මාර්ග බාධක සම්පූර්ණයෙන් ම ක්‍රියාත්මක වේ.

4. කෝවිල අවට මාර්ග බාධක ඉදිකරන ස්ථාන යාපනය මහ නගර සභාව විසින් තීරණය කරනු ඇත. මෙම මාර්ග බාධක කෝවිල් පරිපාලනය, මාර්ග සංවර්ධන අධිකාරිය, මාර්ග බාධක ප්‍ර දේශය තුළ පදිංචි ස්ථිර පදිංචිකරුවන් සහ ස්ථිර වෙළඳුන්ගේ අදහස් සැළකිල්ලට ගැනීමෙන් පසු, විශේෂඥ කමිටුවේ නිර්දේශයන්ට අනුකූලව යාපනය මහ නගර සභාව විසින් තීරණය කරනු ලැබේ.

5. කෝවිල අවට මාර්ග වසා ඇති අවස්ථාවන්හි දී, පේදුරුතුඩුව පාර හරහා පැමිණෙන වාහන විකල්ප මාර්ග හරහා යාපනය මහ නගර සභාව ඉදිරිපිට ඇති නල්ලූර් හරස් මාර්ගය ඔස්සේ ගමන් කර නාවලර් පාර ආනෛපිපන්ති හන්දිය හරහා යාපනය නගරයට ළඟා වේ. එලෙසටම යාපනය නගරයේ සිට පැමිණෙන වාහන ඉහත මාර්ග ඔස්සේ පේදුරුතුඩුව පාරට ළඟා වේ. කෙසේ වෙතත්, සප්පරම්, රථ උත්සවය, දිය කැපීම වැනි විශේෂ උත්සවවල දී පේදුරුතුඩුව පාරෙන් පැමිණෙන වාහන මුත්තිරෙයි හන්දියෙන් හැරී ගොස් කච්චේරි නල්ලූර් පාරෙන්ම ගමන් කිරීමට අවසර දෙනු ලැබේ. යාපනය නගරයේ සිට පැමිණෙන වාහන එම මාර්ගය ඔස්සේ ම පැමිණීමට අවසර දෙනු ලැබේ.

6. කෝවිල් පරිශ්‍රයේ මාර්ග බාධක දමා ඇති ප්‍රදේශය තුළ වෙසෙන ස්ථිර පදිංචිකරුවන්ට සහ ස්ථිර වෙළෙඳ ව්‍යාපාර කටයුතුවල නියැලී සිටින අයවළුන්හට, ඔවුන්ගේ දෛනික සෞඛ්‍ය සහ හදිසි, අත්‍යවශ්‍ය අවශ්‍යතාවලට අගතියක් නොවන පරිදි සහ අවශ්‍ය තහවුරු කිරීම් සහිතව, ඔවුන්ගේ වාහන සඳහා අවශ්‍ය මාර්ග සඳහන් කොට බලපත්‍රයක් නගර සභාව විසින් නිකුත් කරනු ලැබේ. මෙම බලපත්‍ර එක් එක් මාර්ගයන් සඳහා වෙනස් වර්ණවලින් යුක්ත වේ.

7. උත්සව සමයේ දී, කෝවිල් පාලනාධිකාරිය විසින් කෝවිලේ පිටත මාර්ගය රතු සහ සුදු වර්ණයෙන් යුත් කොඩි යොදා මායිම් කරන ලද පූද බිමේ, අභ්‍යන්තර මාර්ග බාධක ප්‍රදේශවලට ඇතුළුවීමට අවසර ඇත්තේ නගර සභාවේ වාහන, විශේෂ අවසර පත්‍රයක් ලබාගෙන ඇති දේවස්ථානයේ ස්ථිර පදිංචිකරුවන් සහ ස්ථිර වෙළඳුන්ගේ වාහනවලට පමණි.

8. සියලුම පළමු සහ දෙවන මාර්ග බාධක තුළ කිසිදු වාහනයක් මාර්ගය දෙපස නවතා තැබීමට අවසර දෙනු නොලැබේ. දෙවියන්ගේ ප්‍රතිමාව වීදි සංචාරය කරන අතරවාරයේ දී මාර්ග බාධක හරහා කිසිදු වාහනයකට ඇතුළුවීමට අවසර දෙනු නොලැබේ.

9. කෝවිලේ පිටත මාර්ගයේ රතු සහ සුදු පැහැති කොඩිවලින් මායිම්කර ඇති පූදබිමට පිටතින් හා පිටතින් ඇති මාර්ග බාධක තුළ ඇති උත්සව සමයේ දී පිහිටුවන ලද වෙළඳ මධ්‍යස්ථානවලට ප. ව. 1.00 - ප. ව. 2.30 දක්වාත් රාත්‍රී 10.00 සිට පසුදින අළුයම 2.00 දක්වාත් භාණ්ඩ පැටවීමට සහ බෑමට අදාළ වාහනවලට අවසර දෙනු ලැබේ. මෙම අවස්ථාවල දී, තාවකාලික ව්‍යාපාරික කටයුතු තහවුරු කරමින් මහ නගර සභාව විසින් නිකුත් කරන ලද කුවිතාන්සිය වාහන බලපත්‍රයක් ලෙස භාවිතා කළ හැකිය.

10. කෝවිලට භාර ඉටු කිරීම සඳහා පැමිණෙන ට්‍රැක්ටර් සහ වාහනවලින් පැමිණෙන එල්ලෙන කාවඩි ඇතුළු කාවඩි සියල්ලක්ම කෝවිල ඉදිරිපිටින් ඇතුළු විය හැක්කේ පේදුරුතුඩුව පාරෙන් පමණි. එලෙසට පැමිණෙන කාවඩි පේදුරුතුඩුව පාරේ ශ්‍රී මුරුගන් ජල තොරණ ඉදිරිපිටින් බෑමෙන් පසු සියලුම එල්ලෙන කාවඩි සහිත වාහන හෙට්ටි  වීදියෙන් පිටවීමට කටයුතු කෙරේ.

11. කෝවිලේ අභ්‍යන්තර හා පිටත ප්‍රදේශයේ ආරක්ෂක කටයුතු පොලීසිය විසින් සිදු කරනු ලබන අතර, මාර්ග බාධකවල නගර සභා සේවකයින් සමඟ පොලීසිය ද රාජකාරියේ යෙදෙනු ඇත. යාපනය මහ නගර සභාව මගින් කෝවිල් බාහිර පරිසරයේ නිරීක්ෂණ කැමරා සවිකර නිරීක්ෂණ කටයුතු සිදු කරනු ලැබේ.

12. කෝවිල් පරිසරයේ සනීපාරක්ෂාව, පානීය ජල සැපයුම, වීදිවලට ජලය ඉසීම, ඝන, ද්‍රව අපද්‍රව්‍ය බැහැර කිරීම, විදුලි පහන් අළුත්වැඩියාව, කෝවිල් පිටත මාර්ගය සඳහා වැලි මිල දී ගැනීම සහ ඒවා පැතිරීම, කෝවිල් පරිසරයේ ඇති දන්සැල් සඳහා ගාස්තු ගෙවීමේ පදනම මත වැලි සැපයීම, මාර්ග බාධක නඩත්තු කිරීම, සමස්ත පරිපාලන සම්බන්ධීකරණය සහ අධීක්ෂණය යාපනය මහ නගර සභාව විසින් සිදු කරනු ලැබේ.

13. කෝවිල් පරිශ්‍රය තුළ ආහාර දානමය කටයුතු කරන ස්ථාන, බීම වර්ග ලබාදෙන ස්ථාන සහ ආහාර පරිහරණය කරන ස්ථාන සනීපාරක්ෂක ප්‍රමිතීන්ට අනුකූලව පවත්වාගත යුතුය. මේවා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාගේ සෘජු අධීක්ෂණය යටතේ නිරීක්ෂණය කෙරේ.

14. මහ නගර සභාව විසින් ආරක්ෂක කටයුතු සඳහා කැඳවනු ලබන පොලිස් නිලධාරීන්ට සහ උත්සව සමයේ දී මහ නගර සභාව සමග සහයෝගයෙන් රාජකාරීවල නියැලී සිටින ස්වේච්ඡා සංවිධාන සඳහා පහසුකම් සැපයීම නගර සභාව විසින් සිදු කරනු ලැබේ.

15. කෝවිල් පරිශ්‍රය තුළ රථ ගාල් ඉදිකිරීම සඳහා මහ නගර සභාවෙන් අනුමැතිය ලබා ගත යුතුය. රථ ගාල් කිරීමේ ගාස්තු සම්බන්ධයෙන් මහ නගර සභාව විසින් තීරණය කරනු ලබන ගාස්තු පමණක් අය කළ හැකිය.

16. කෝවිල් පරිශ්‍රයේ තාවකාලික වෙළඳසැල් පිහිටුවීම සඳහා සිතියමක් යාපනය මහ නගර සභාව විසින් විශේෂඥ උපදෙස් මත පදනම්ව සකස් කරනු ලබන අතර එම වෙළඳසැල් ටෙන්ඩර් ක්‍රියාවලිය මඟින් ලබා දෙනු ඇත.

17. උත්සව සමයේ දී කෝවිල් පරිශ්‍රය තුළ පහත සඳහන් කරුණු තහනම් කර ඇත.

- උත්සව කාලය තුළ සහ සුදු පැහැති කොඩිවලින් මායිම් කර ඇති පූද බිමේ අභ්‍යන්තර මාර්ග බාධක යොදා ඇති ප්‍රදේශ තුළ කිසිම අයුරකින් තාවකාලික වාණිජ කටයුතු, වෙළඳ දැන්වීම්, ප්‍රචාරණ හෝ විකාශන කටයුතු සිදු කිරීම.

- උත්සව සමයේ දී කෝවිලේ පිටත මාර්ගවල පාවහන් පැළඳගෙන ඇතුළුවීම.

- උත්සව සමයේ දී කෝවිල් පරිශ්‍රය තුළ අධ්‍යාත්මික නොවන වෙළඳ දැන්වීම්, ප්‍රචාරණ හෝ විකාශන කටයුතු සිදු කිරීම.

- උත්සව සමය තුළදී ළමුන් යොදාගනිමින් ව්‍යාපාර සහ යාචක කටයුතුවල යෙදීම.
- උත්සව සමයේ දී කෝවිල් පරිසරය තුළ ඩ්‍රෝන් (Drone) කැමරා පියාසර කරවා වීඩියෝ පටිගත කිරීම, හෙලිකොප්ටරයක් භාවිතා කරමින් මල් ඉසිරීම සහ ගිනිකෙළි සංදර්ශන පැවැත්වීම.
- උත්සව සමයේ දී කෝවිල් පරිශ්‍රයන්හි පොලිතීන් භාවිතය (මධ්‍යම පරිසර අධිකාරියේ *ගැසට් නිවේදනය* 2034/33,34, 35, 36, 37, 38 - 2017.09.01, 2211/51 - 2021.01.21, 2341/30-2023.07.19, 2353/55 - 2023.10.12).
- කෝවිල් පරිසරයේ උත්සව සමයේ දී ප්‍රකාශයට පත් කරන පත්‍රිකාවල දේවරූප මුද්‍රණය කිරීම.

18. වාර්ෂිකව පවත්වනු ලබන සාකච්ඡා මත පදනම්ව , පවතින වාතාවරණය අනුව ආරක්ෂක සහ සෞඛ්‍ය හේතුන් මත යාපනය මහ නගර සභාවේ විධිවිධානවල සුළු වෙනස්කම් සිදු කළ හැකිය.

යාපනය මහ නගර සභාව විසින් 2023.09.15 දිනැති අංක 2350 දරන *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසෙහි ප්‍රකාශයට පත් කරන ලද නල්ලූර් කන්ද සුවාමි කෝවිලේ මහා උත්සව සමයේ දී යාපනය මහ නගර සභාව විසින් සිදු කිරීමට නියමිත ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වූ ප්‍රකාශනය මෙයින් අවලංගු කෙරේ.

07-835

---

# විවිධ දැන්වීම්

**ගම්පහ මහා නගර සභාව**

විනෝද බදු - 2025 වර්ෂය

ගම්පහ මහා නගර සභාවේ 2025 වර්ෂය සඳහා බදු පැනවීමේ 2024.12.27 දිනැති හා 2417 අංක දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පිටු අංක 6163 හි පළ කරන ලද, අය කරනු ලබන විනෝද බදු ප්‍රතිශතය පිළිබඳ නිවේදනය ගම්පහ මහා නගර සභාවේ නගරාධිපති වන මා විසින් 2025.07.09 දිනැති හා අංක 25 දරන මහා සභා තීරණය යටතේ සංශෝධනය කළ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

**යෝජනාව**

ගම්පහ මහා නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන සෑම ආධාරක චිත්‍රපටි දර්ශනයක්, මැජික් සංදර්ශනයක්, සර්කස් සංදර්ශනයක්, සංගීත සංදර්ශනයක්, ප්‍රදර්ශන ක්‍රීඩා තරගයක්/ඉසව්/සංදර්ශන, ඕනෑම වර්ගයේ සැණකෙළියක්, විනෝද ක්‍රීඩා ඉසව්/ සංදර්ශනයක් සඳහාම මුද්‍රණය කරනු ලබන ප්‍රවේශ පත්‍ර වල වටිනාකමින් 12%ක විනෝද බද්දක් ගෙවිය යුතු ය.

එරික් ලක්ෂ්මන් එදිරිවික්‍රම,
නගරාධිපති,
ගම්පහ මහා නගර සභාව.

2025 ජූලි මස 09 වැනි දින,
ගම්පහ මහා නගර සභා කාර්යාලයේ දී ය.

07-838/1

සංශෝධනය

**ගම්පහ මහා නගර සභාව**

මාර්ග පළුදු කිරීම සඳහා මිළ ගණන් කැඳවීම

ගම්පහ මහා නගර සභාවේ 2025 වර්ෂය සඳහා බදු පැනවීමේ 2024.12.27 දිනැති හා 2417 අංක දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පිටු අංක 6183 හි පළ කරන ලද, මාර්ග පලුදු කිරීම් සඳහා අය කරනු ලබන මිල ගණන් පිළිබඳ නිවේදනයේ සඳහන් මිල ගණන් පහත සඳහන් පරිදි ගම්පහ මහා නගර සභාවේ නගරාධිපති වන මා විසින් 2025.07.09 දිනැති හා අංක 30 දරන මහා සභා තීරණය යටතේ සංශෝධනය කළ බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

එරික් ලක්ෂ්මන් එදිරිවික්‍රම,
නගරාධිපති,
ගම්පහ මහා නගර සභාව.

2025 ජූලි මස 09 වැනි දින,
ගම්පහ මහා නගර සභා කාර්යාලයේ දී ය.

ගම්පහ මහා නගර සභාව

| *අනු. අංකය* | *විස්තරය* | *සංශෝධනය විය යුතු මුදල රු. ශත* |
|---|---|---|
| 01 | මාර්ග පළුදු කිරීම තාර (1$m^2$) | 35,000.00 |
| 02. | මාර්ග පළුදු කිරීම කොන්ක්‍රීට් (1$m^2$) | 35,000.00 |
| 03 | මාර්ග පළුදු කිරීම කාපට් (1$m^2$) | 35,000.00 |
| 04 | මාර්ග පළුදු කිරීම ඉන්ටලොක් (1$m^2$) | 5,000.00 |
| 05. | වීථිරේඛා අයදුම්පතක් සඳහා | 100.00 |
| 06 | අනුමත කරන ලද සැලසුම් පිටපතේ සත්‍ය පිටපතක් ලබා දීම සඳහා | 500.00 |
| 07 | තොරතුරු පනතින් ඉල්ලා සිටින පිටපත් ලබා දීම සඳහා (තනි පිට A4 ප්‍රමාණය) | 2.00 |
| | (දෙපිට A4 ප්‍රමාණය) | 3.00 |
| 08 | විනය පරීක්ෂණ සඳහා පිටපත් ලබා දීම (තනිපිට A4 ප්‍රමාණය) | 4.00 |
| | (දෙපිටA4 ප්‍රමාණය) | 5.00 |

07-838/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.